**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහන - 2 අදියර - 2022**

----------------------------------------------------------------------------------------------------------------------------

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහනේ - 2 අදියරේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කොළඹ මහ නගර සභාව සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජුනි 03 දින එළඹි අංක 3030 දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.10 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය**

ණය ගිවිසුමට අනුව, එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා කළමනාකරණය කිරීම සහ මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදනය හා අපජල සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම ප්‍රකාරව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,230.60කට සමාන එජඩො මිලියන 9.44ක් වන අතර ඉන් රු.මිලියන 1,042.88කට සමාන එජඩො මිලියන 08ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 187.22කට සමාන එජඩො මිලියන 1.44ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. වැඩසටහන එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 23 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් තිබුණි. කෙසේවෙතත්, වැඩසටහනේ කටයුතු අවසන් කිරීමේ දිනය 2022 ඔක්තෝබර් 24 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

වැඩසටහනේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය

කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම

| අංකය | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 හි 9.3 ඡේදය | මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස 2 කට වරක් රැස්විය යුතුවේ. කෙසේවෙතත්, 2022 වර්ෂය තුළ මෙහෙයුම් කමිටු රැස්වීම් හතරක් පමණක් පවත්වා තිබුණි. | 2022 ආරම්භයේ ඉන්ධන අර්බුදය සහ අමාත්‍යාංශයේ විෂය පථය නිරන්තරයෙන් වෙනස් වීම හේතුවෙන් රැස්වීම් කැඳවීම සීමා කර තිබුණි. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් චක්‍රලේඛ උපදෙස් අනුව පැවැත්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2019 ජනවාරි 12 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව අංක 01/2019 දරන චක්‍රලේඛය | වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම හතරක් පැවැත්වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 වැඩසටහනේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| **සංරචකය** | **2022 දෙසැම්බර් 31 දිනට** | | **විගණන ගැටලුව** | **ප්‍රමාදයට හේතු** |
|---|---|---|---|---|
| | **අපේක්ෂිත භෞතික කාර්යසාධනය** | **අත්කරගත් කාර්යසාධනය** | | |
| | **ප්‍රතිශතය** | **ප්‍රතිශතය** | | |
| සැලසුම්කරණය අධීක්ෂණය ආයතන සංවර්ධන උපදේශකයින් | 100 | 65 | වැඩසටහන 2014 ජුනි 3 වන දින ආරම්භ කර 2019 ජුනි 30 වන දින අවසන් කිරීමට නියමිතව තිබුණද, නිමකිරීමේ දිනය 2022 ඔක්තෝබර් 24 දක්වා දෙවරක් දීර්ඝ කර තිබුණි. 2022 ඔක්තෝබර් 24 දිනට ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය සියයට 57.27 විය. කෙසේවෙතත්, සම්පූර්ණ කරන ලද එක් ව්‍යාපෘති ප්‍රතිදානයක් සමඟ වැඩසටහන නිමකර තිබුණි. | කොන්ත්‍රාත් කළමනාකරණයේ, ව්‍යාපෘති වෙන් කිරීම, ශක්‍යතා අධ්‍යයනය, පාරසරික තක්සේරුව, ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් මෙම වැඩසටහන මන්දගාමී වැඩසටහනක් ලෙස දක්වා ඇත. |
| | | | II උපදේශන සමාගමක් තෝරා ගැනීම සඳහා මුළු ව්‍යාපෘති කාලයෙන් සියයට 33ක කාලයක් වැය කර ඇත. කෙසේ වෙතත්, එකඟ වූ කාල සීමාවට අනුව උපදේශක සමාගමට වැඩ නිම කිරීමට නොහැකි විය. පසුව කොන්ත්‍රාත්තුව වර්ෂ 2 1/2 කින් දෙවරක් දීර්ඝ කර තිබුණි. | කොන්ත්‍රාත් කළමනාකරණයේ, ව්‍යාපෘති වෙන් කිරීම, ශක්‍යතා අධ්‍යයනය, පාරසරික තක්සේරුව, ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් මෙම වැඩසටහන මන්දගාමී වැඩසටහනක් ලෙස දක්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (අ) මාදම්පිටියේ අපජල පවිත්‍රාගාරය | 100 | 97 | මාදම්පිටිය අපජල පවිත්‍රාගාරයේ ඉදිකිරීම් ප්‍රමාද වීම හේතුවෙන් දිනකට පොම්පාගාරයට ලැබෙන අපජලය ඝන මීටර් 95,000ක් පමණ කිසිදු පවිත්‍රකරණයකින් තොරව මුහුදට මුදා හැරීමට සිදුව ඇති බව නිරීක්ෂණය විය. | අපජල පවිත්‍රාගාරය ඉදිකිරීමට අවශ්‍ය ඉඩම 2022 දෙසැම්බර් 31 දින වන විට නාගරික සංවර්ධන අධිකාරියෙන් පවරාගෙන නොතිබුණු අතර පරිසර බලපෑම් ඇගයීම් වාර්තාව සකස් කිරීම මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් තාවකාලිකව නතර තිබුණි. |
| (ආ) උතුරු ජල පෝෂක ප්‍රදේශයේ ප්‍රදේශ 7ක් සඳහා මලාපවහන පහසුකම් සැපයීම | 100 | 91 | පොම්පාගාර වැඩබිමේ භූවිද්‍යාත්මක සමීක්ෂණය සහ මාර්ග ජාලයේ සඳහා වන කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. කෙසේවෙතත්, භූ තාක්‍ෂණික විමර්ශනය සඳහා කොන්ත්‍රාත්තුව සඳහා ලංසු තැබීම අවසන් කර නොමැත. 2022 දෙසැම්බර් 31 දිනට උපදේශන කොන්ත්‍රාත්තු පිරිවැය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකළ අතර 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රමාද කාලය මාස 39ක් පමණ විය. | අතිරේක ණය අරමුදල් නොමැතිකම හේතුවෙන් මෙම ක්‍රියාකාරකමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තාවකාලිකව නවතා ඇත. |
| (ඇ) උතුරු ජල පෝෂක ප්‍රදේශයේ දැනට පවතින කුඩා පොම්පාගාර 5ක් පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම | 100 | 69 | කොළඹ මහනගර සභාව ඔවුන්ගේම අරමුදල් මගින් තත්ත්ව තක්සේරුව සිදුකිරීමට තීරණය කර තිබුණද 2022 දෙසැම්බර් 31 දිනට තත්ත්ව තක්සේරු කිරීම ආරම්භ කර නොතිබුණි. | සංවර්ධන කටයුතු සඳහා අරමුදල් නොමැති වීම. |
| (ඈ) මාලිගාවත්තේ සිට මාදම්පිටිය පොම්පාගාරය දක්වා මූලික බදක් සහිත මලාපවහන ඉදිකිරීම | 100 | 91 | 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රමාද කාලය මාස 39කට ආසන්න විය. | අරමුදල් සීමා කිරීම හේතුවෙන් වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) උතුරු ජල පෝෂක ප්‍රදේශයේ මලාපවහන වැඩිදියුණු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ අලුත්වැඩියා කිරීම | 100 | 82 | 2019 සැප්තැම්බර් 28 වැනි දින සමාලෝචනය සඳහා කෙටුම්පත් ලංසු ලියවිලි ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කරන ලද නමුත් එය අනුමත නොකළ අතර එමනිසා භූගෝලීය සමීක්ෂණ ප්‍රදානය කිරීම ප්‍රමාද වී ඇත. | අරමුදල් සීමා කිරීම හේතුවෙන් වේ. |
| (ඊ) ජෛව ඝන ද්‍රව්‍ය කළමනාකරණය | 100 | 82 | ජෛව ඝන ද්‍රව්‍ය කළමනාකරණ මාර්ගෝපදේශ සකස් කිරීම පිළිබඳ අවසන් වැඩමුළුව 2017 නොවැම්බර් 13 දින පැවැත්වුවද, ගැසට් නිවේදන සඳහා වන අවසන් මාර්ගෝපදේශ 2022 දෙසැම්බර් 31 දින දක්වා සිංහල සහ දෙමළ භාෂාවට පරිවර්තනය කර නොතිබූ බව නිරීක්ෂණය විය. | එය පරිසර අධිකාරිය විසින් සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කර ගැසට් කළ යුතුය. |

**කළමනාකරණයේ අදහස් දැක්වීම** මලාපවහන පද්ධති සංවර්ධනය පිළිබඳ දැනුම ඇති උපදේශකයින් තෝරා ගැනීම දුෂ්කර කාර්යයක් වීම, අරමුදල් නොමැතිකම සහ පවතින කොන්ත්‍රාත්තුවේ දුර්වල ප්‍රගතිය ප්‍රමාද වීමට හේතු විය.

**විගණකගේ අදහස් දැක්වීම** ප්‍රතිපාදන වෙන්කර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| (අ) කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම හේතුවෙන් මුළු උපදේශන වියදම් ඩොලර් මිලියන 5.29 දක්වා සියයට 61 කින් වැඩි වී ඇත. කෙසේවෙතත්, අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට නොතිබුණි. | දීර්ඝ කිරීම නිසා උපදේශන පිරිවැය වැඩි වී ඇති බව සත්‍ය වේ. නමුත් කොන්ත්‍රාත්තුවේ මුළු උපදේශකයින් සංඛ්‍යාවෙන් අවම උපදේශකයින් සංඛ්‍යාව පමණක් බඳවා ගෙන ඇත. එසේම, ඔවුන් කොන්ත්‍රාත්තුවේ මුල් විෂය පථය නොවූ වරාය නගර සංවර්ධනයෙහි මලාපවහන සම්බන්ධ කිරීමේ සැලසුම් කටයුතු සඳහා ඔවුන් වෙත පවරා ඇත. කොන්ත්‍රාත්තුවේ ප්‍රතිපාදනයට | කොළඹ මහ නගර සභාවේ කාර්ය මණ්ඩලය විසින් ඉතිරි කටයුතු අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අනුව කොළඹ පාරිභෝගික මිල දර්ශකයට (CCPI) අනුකූලව වාර්ෂික අනුපාතය වැඩිවීම හේතුවෙන් උපදේශකයින්ගේ පිරිවැය ද වැඩි වී ඇත. | |
| (ආ) Closed-Circuit Television<br>කිසිදු මුල්‍යාන ක්‍රමයකින් තොරව ව්‍යාපෘතියේ අවසන් දින සිට මාස 8 කට ඔබ්බට සංවෘත පරිපථ රූපවාහිනී කොන්ත්‍රාත්තුවක් සඳහා සමාගමක් සමඟ ගිවිසුමක් අත්සන් කරන ඇත. ව්‍යාපෘතිය වසා දැමීම හේතුවෙන් රු. මිලියන 3.12ක අමතර ගෙවීමක් සමඟ සීසීටීවී (CCTV) කොන්ත්‍රාත්තුව 2022 ඔක්තෝබර් 24 වන දින අවසන් කරන ලදී. කෙසේ වෙතත්, කිලෝමීටර් 89ක ගුරුත්වාකර්ෂණ කාණුවලින් කිලෝමීටර් 58ක් සහ මැන්හෝල් 1974 කින් මැන්හෝල් 1242ක් නිම කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන විට කොන්ත්‍රාත් කාලය ණය අවසන් දිනය ඉක්මවා ඇති බව දන්නා කරුණකි. නමුත් කොන්ත්‍රාත්තුවේ ඉතිරි කාලය සම්පූර්ණ කිරීම සඳහා රජයෙන් අමතර අරමුදල් ලබා ගත හැකි බවට අපේක්ෂාවක් තිබුණි. එසේම, ණය ගිවිසුම අවසන් වීමට පෙර කොන්ත්‍රාත්තුවේ විෂය පථය උපරිම කිරීම සඳහා වැඩ වේගවත් කිරීමට අන්නෝන්‍ය එකඟතාවක් ඇති විය. ඒ අනුව, කොන්ත්‍රාත්තුවේ පළමු අදියර එනම්, කොන්ත්‍රාත්තුවේ ඉතාමත් දුෂ්කර සහ වැදගත්ම අංගයක් වූ විශේෂ උපාංග භාවිත කරමින්, ප්‍රධාන මාර්ගවල (Force Mains) කිලෝමීටර 8.3 ක තත්ත්වය තක්සේරු කිරීම සහ හදිසි අලුත්වැඩියාව සම්පූර්ණයෙන් නිමකිරීමට සමත් විය. කොන්ත්‍රාත්තුවේ 2 වන කොටස වූ සීසීටීවී හරහා ගුරුත්වාකර්ෂණ මලාපවහනවල තත්ත්වය තක්සේරු කිරීම වන අතර ඉන්ධන සහ විදුලිය නොමැතිකම හේතුවෙන් මාස තුනක කාලයක් වැඩ නතර කිරීමට සිදු වුවද වැඩ කොටසක් සම්පූර්ණ කිරීමට හැකි විය. | කොළඹ මහ නගර සභාවේ විසින් තක්සේරු වාර්තාව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍යාංශ ලේකම්වරයා විසින් උපදේශන සමාගම සමඟ අත්සන් කර ඇති කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, සවිස්තරාත්මක සැලසුම් කිරීම, ඉදිකිරීම් අලංකාර කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය කිරීම උපදේශක සමාගමට සිදුකිරීමට අවශ්‍ය වේ. එසේ වුවද, 2017 මැයි 04 වන දින M/S Larsen and Toubro සමඟ අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, දෙවන කොටස සඳහා පොම්පාගාර ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය, අධි පීඩන නළ සහ ගුරුත්වාකර්ෂණ නළ එළීම සඳහා සැලසුම් සකස් කිරීම සඳහා කොන්ත්‍රත්කරු වෙත භාර දී ඇත. කොන්ත්රාත්කරු. ඒ අනුව සැලසුම් ක්‍රියාකාරකම් සඳහා උපදේශන ආයතනයට ගෙවීම් කරන අතරම එම කාර්යය සඳහා කොන්ත්‍රාත් සමාගමට ද ගෙවීම් සිදු කර ඇති අතර, එම කාර්යය සඳහාම දෙගුණයක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත | ක්‍රියාත්මක කරවීමේ ආයතනය විසින් අධ්‍යයනය කළ යුතුය. |
| (ඇ) | උපදේශන සමාගම සමඟ ඇති කර ගත් කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, කාල පදනම අනුව ගෙවීම් සිදු කරනු ලැබේ. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම ප්‍රමාද වීම, ඉඩම් නිදහස් කිරීම වැනි හේතු නිසා ඇති වූ කොන්ත්‍රාත් ප්‍රමාදය හා ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් අධීක්‍ෂණය සඳහා උපදේශන ආයතනයට ඵල රහිත ගෙවීමක් කර තිබුණි.<br>i. දැනට පවතින මලාපවහන පද්ධතියේ කිලෝමීටර් 59ක තත්ත්ව පරීක්ෂාවට අදාළ නිර්දේශ ලබා ගැනීම.<br>ii. කිලෝමීටර 22කින් සහ කිලෝමීටර 7 අර්ධ වශයෙන් නිම කර සම්පූර්ණයෙන් නල එළීමට ඇති භූගත හා පීඩන මලාපවහන ජාල පද්ධතිය ඇතුළුව අර්ධ වශයෙන් නිම කරන ලද තලකොටුව සහ කාලිංග මාවත පොම්පාගාර ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුවේ අධීක්ෂණය<br>iii. වැල්ලවත්තේ අලුතින් ඉදිකිරීමට නියමිත අපජල පවිත්‍රාගාරයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අධීක්ෂණය<br>iii. කිරුළ - නාරාහේන්පිට මලාපවහන ජාල පද්ධතිය කිලෝමීටර් 12.4 එළීම සහ පොම්පාගාර දෙකක් ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුව අධීක්ෂණය කිරීම.<br>iv. දකුණු ජල පෝෂක ප්‍රදේශයේ දැනට පවතින අපජල අපවහන ජාල පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම අධීක්ෂණය කිරීම. | අදහස් දක්වා නොමැත | ක්‍රියාත්මක කරවීමේ ආයතනය විසින් අධ්‍යයනය කළ යුතුය. |